# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2021 ජූනි

03 වෙළුම 06 නිකුතුව


## විශේෂ සිදුවීම්





2021 වසරේ ජූනි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,007ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 12.6කින් ඉහළ ගියේය.

2021 වසරේ ජූනි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,659ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 57.2කින් ඉහළ ගියේය.





2021 වසරේ පළමු භාගය තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 29.1කින් සහ සියයට 30.5කින් ඉහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය 2020 වසරේ ජූනි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 161ට සාපේක්ෂව, 2021 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 652ක් දක්වා වැඩි විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- ජූනි)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-ජූනි)




### අපනයන පරිමා දර්ශකය - (ජන.-ජූනි)





සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ පළමු භාගය තුළ දී අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය.


සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ පළමු භාගය තුළ දී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ජූනි)




### තේ සහ රබර් මිල ගණන් *





* කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල්-අගෝස්තු කාලපරිච්ඡේදයේ දී රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.


ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු, පොල් සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ පළමු භාගය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ජූනි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2021 වසරේ පළමු භාගය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඛනිජතෙල් නිෂ්පාදිත සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-ජූනි)





### ආනයන පරිමා දර්ශකය (ජන.-ජූනි)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ පළමු භාගය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, ආනයන පරිමා දර්ශකය ද ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ජූනි)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





2021 වසරේ පළමු භාගය තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් එළවළු, සීනි හා රසකැවිලි සහ කිරි නිෂ්පාදිත ඇතුළු ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා හේතු විය. පෞද්ගලික රථවාහන ආනයන වියදම පහළ යෑම හමුවේ වුව ද, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, විදුලි සංදේශ මෙවලම් සහ ගෘහ උපකරණ ආනයන වියදම ඉහළ යෑමත් සමඟ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-ජූනි)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





*2021 වසරේ මාර්තු සහ ජූනි මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත සහ මූල ලෝහ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ පළමු භාගය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය තුළ දී පොහොර සහ ඛනිජමය නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-ජූනි)**




ප්‍රධාන වශයෙන්ම, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජූනි- 20 | ජූනි - 21 | වෙනස (%) | ජන. -ජූනි 2020 | ජන.-ජූනි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **229.1** | **230.3** | **0.5** | **1,039.0** | **1,258.9** | **21.2** |
| එයින් | තේ | 114.9 | 123.9 | 7.8 | 571.7 | 650.5 | 13.8 |
| | පොල් | 34.2 | 38.6 | 12.7 | 146.8 | 196.2 | 33.7 |
| | කුළුබඩු | 31.5 | 35.5 | 12.8 | 113.8 | 196.8 | 72.9 |
| | මුහුදු ආහාර | 24.3 | 15.8 | -35.1 | 99.1 | 106.4 | 7.3 |
| **කාර්මික අපනයන** | | **661.3** | **771.4** | **16.6** | **3,357.1** | **4,407.7** | **31.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 403.7 | 415.5 | 2.9 | 1,943.9 | 2,487.4 | 28.0 |
| | රබර් නිෂ්පාදිත | 66.0 | 92.9 | 40.7 | 335.7 | 499.7 | 48.8 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 16.7 | 41.3 | 147.3 | 219.5 | 196.7 | -10.4 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.7 | 41.7 | 0.0 | 197.8 | 248.0 | 25.4 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 30.2 | 45.2 | 49.8 | 146.5 | 242.1 | 65.3 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 11.2 | 21.2 | 89.5 | 72.7 | 132.1 | 81.6 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.9 | 4.7 | -20.1 | 26.1 | 22.5 | -13.7 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.7** | **5.4** | **44.9** | **16.7** | **32.4** | **94.0** |
| **මුළු අපනයන** | | **894.1** | **1,007.0** | **12.6** | **4,412.8** | **5,699.0** | **29.1** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජූනි- 20 | ජූනි - 21 | වෙනස (%) | ජන. -ජූනි 2020 | ජන.-ජූනි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **249.1** | **382.2** | **53.4** | **1,782.1** | **1,912.3** | **7.3** |
| **ආහාර හා පාන වර්ග** | | 101.9 | 165.0 | 61.9 | 787.3 | 914.9 | 16.2 |
| එයින් | එළවළු (ආ) | 26.5 | 39.6 | 49.7 | 202.3 | 211.1 | 4.3 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 147.1 | 217.2 | 47.6 | 994.8 | 997.4 | 0.3 |
| එයින් | පෞද්ගලික රථවාහන | 9.2 | 0.4 | -95.9 | 273.4 | 4.4 | -98.4 |
| **අන්තර් භාණ්ඩ** | | **564.8** | **839.0** | **48.5** | **4,166.8** | **5,950.1** | **42.8** |
| එයින් | ඉන්ධන | 110.4 | 66.3 | -40.0 | 1,243.4 | 1,787.2 | 43.7 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 175.7 | 276.8 | 57.5 | 1,065.6 | 1,451.1 | 36.2 |
| | පොහොර | 22.2 | 2.2 | -90.0 | 107.0 | 97.5 | -8.9 |
| | තිරිඟු හා ඉරිඟු | 27.8 | 43.6 | 56.6 | 156.5 | 184.6 | 17.9 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **241.6** | **438.0** | **81.3** | **1,725.7** | **2,152.3** | **24.7** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 146.4 | 270.3 | 84.6 | 990.0 | 1,366.5 | 38.0 |
| **මුළු ආනයන** | | **1,055.5** | **1,659.2** | **57.2** | **7,674.6** | **10,014.7** | **30.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජූනි- 20 | ජූනි - 21 | වෙනස (%) | ජන. -ජූනි 2020 | ජන.-ජූනි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -161.3 | -652.2 | - | -3,261.8 | -4,315.7 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජූනි- 20 | ජූනි - 21 | වෙනස (%) | ජන. -ජූනි 2020 | ජන.-ජූනි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 124.4 | 140.2 | 12.6 | 102.4 | 132.2 | 29.1 |
| | පරිමා දර්ශකය | 143.8 | 156.7 | 8.9 | 112.8 | 146.9 | 30.2 |
| | මිල දර්ශකය | 86.5 | 89.5 | 3.4 | 90.7 | 90.0 | -0.8 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 94.5 | 148.5 | 57.2 | 114.5 | 149.4 | 30.5 |
| | පරිමා දර්ශකය | 115.8 | 146.7 | 26.7 | 135.6 | 164.0 | 21.0 |
| | මිල දර්ශකය | 81.6 | 101.2 | 24.1 | 84.4 | 91.1 | 7.9 |
| **වෙළඳ මිල අනුපාතය** | | 106.1 | 88.4 | -16.7 | 107.4 | 98.8 | -8.0 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද